# 9 පරිච්ඡේදය
# මහ බැංකුකරණය

**දිලිනි ඉන්දීවරී**
indeewari@sjp.ac.lk

**ප්‍රවේශය**

ලොව පුරා මූල්‍ය වෙළඳපොළවල වැදගත්ම ඒකක අතර මුදල් ප්‍රතිපත්ති භාර මහ බැංකු වේ. මහ බැංකු ක්‍රියාවන් පොලී අනුපාතික, ණය ප්‍රමාණ සහ මුදල් සැපයුම කෙරෙහි බලපාන අතර, ඒ සියල්ල මූල්‍ය වෙළඳපොළවල් මත පමණක් නොව සමස්ථ නිෂ්පාදනය සහ උද්ධමනය කෙරෙහි ඍජු බලපෑමක් ඇති කරයි. මෙම පරිච්ඡේදයේ දී, මහ බැංකුවල ප්‍රධාන කාර්යයන් දෙස බලන අතර, විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව කෙරෙහි අවධානය යොමු කරයි. මුදල් ප්‍රතිපත්ති සැකසීම සඳහා මහ බැංකු වගකිව යුතු බැවින්, මහ බැංකු නිතිපතා මහජන විවාදවලට ලක් වේ. කෙසේ වෙතත්, මහ බැංකුවක් ආර්ථික ප්‍රතිඵලවලට බලපෑම් කරන යාන්ත්‍රණයන් පොදු ජනතාව සැමවිටම වටහා නොගත හැකිය. මෙම පරිච්ඡේදය ලියා ඇත්තේ පුළුල් පාඨක ප්‍රජාවක් සඳහා එවැනි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා ය. මෙහි අවසාන වශයෙන් මහ බැංකුකරණයේ අනාගත අභියෝග සහ එම අභියෝගවලට මුහුණ දීමට මහ බැංකු සූදානම් විය හැකි ආකාරය දෙසද බලයි.

## 9.1 හැඳින්වීම

මහ බැංකුවක් යනු රටක හෝ රටවල් සමූහයක මුදල් සැපයුම පාලනය කරන සහ ව්‍යවහාර මුදල් කළමනාකරණය සිදු කරන රාජ්‍ය ආයතනයයි. බොහෝ මහ බැංකුවල ප්‍රධාන අරමුණ වනුයේ මිල ස්ථායිතාවයයි. මහ බැංකු නිර්මාණය වීමට පෙර, භාණ්ඩ හා සේවා හුවමාරු කිරීමේදී ගෙවීමේ මාධ්‍යයක් වශයෙන් වටිනා ලෝහ (රන් හා රිදී) භාවිතා විය. එහෙත් ගනුදෙනු ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟ වර්තමානයේ භාවිතා කරන කාසි හා නෝට්ටු දක්වා මුදලේ විකාශනය සිදු විය. ඒ සමඟ මුදල් නිකුත් කිරීමට සහය දැක්වීමට සහ එය මධ්‍යගත කිරීමට ආයතනයක් අවශ්‍ය විය. එම අරමුණින් දහහත්වන සියවසේ ආරම්භ වූ "මහ බැංකුව" නම් ආයතනය, සාපේක්ෂව කෙටි කාලයක් තුළ, සෑම කෙනෙකුගේම දෛනික ජීවිතයට විශාල ලෙස බලපාන වැදගත් රාජ්‍ය ආයතනක් දක්වා පරිණාමය වී ඇත.

මහ බැංකු සඳහා සාමාන්‍යයෙන් අදාළවන ප්‍රධාන කාර්යයන් සහ වගකීම් කිහිපයක් පෙන්වා දිය හැක.

1. මුදල් ප්‍රතිපත්තිය:
   නිශ්චිත සාර්ව ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් සැපයුම සහ පොලී අනුපාතික කළමනාකරණය කිරීම ඇතුළත් වන මුදල් ප්‍රතිපත්තිය මහ බැංකු පිළියෙල කර ක්‍රියාත්මක කරයි. ඔවුන් උද්ධමනය පාලනය කිරීමට, ආර්ථිකය ස්ථායි කිරීමට, රැකියා ප්‍රවර්ධනය කිරීමට සහ ආර්ථික වර්ධනය කිරීමට විවට වෙළෙඳපොළ කටයුතු, සංචිත අවශ්‍යතා සහ ණය පහසුකම් වැනි විවිධ මෙවලම් භාවිතා කරයි.

2. ව්‍යවහාර මුදල් නිකුත් කිරීම:
   රට තුළ මුදල් නිකුත් කිරීම සහ පාලනය කිරීම සඳහා මහ බැංකු වගකිව යුතුය. ඔවුන් ව්‍යවහාර මුදල් (කාසි හා නෝට්ටු) නිකුත් කිරීම සහ ව්‍යාජ මුදල් නෝට්ටු සැකසීම වැළැක්වීම සඳහා කටයුතු කරයි.

3. බැංකු අධීක්ෂණය සහ නියාමනය:
   වාණිජ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීමේ භූමිකාවක් මහ බැංකුවලට බොහෝ විට ඇත. ඔවුන් බැංකු පද්ධතියේ ස්ථායිතාවය සහ සෞභාග්‍ය සහතික කිරීම, තැන්පතුකරුවන් ආරක්ෂා කිරීම සහ මූල්‍ය ස්ථාවරත්වය පවත්වාගෙන යාම සඳහා විචක්ෂණශීලී නියාමන සකස් කර ක්‍රියාත්මක කරයි.

4. අවසාන වශයෙන් ණය දෙන්නා:
   ද්‍රවශීලතා අර්බුදවලට මුහුණ දෙන බැංකුවලට හෝ මූල්‍ය ආයතනවලට හදිසි ද්‍රවශීලතා ආධාර සැපයීම සඳහා මහ බැංකු අවසාන වශයෙන් ණය දෙන්නන් ලෙස ක්‍රියා කරයි. ණය ලබා දීමෙන්, පද්ධතිමය අවදානම් වළක්වා ගැනීම හෝ අවම කර ගැනීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය පවත්වා ගැනීම ඔවුන්ගේ අරමුණයි.

5. විදේශ සංචිත:
   මහ බැංකු විසින් රටක විදේශ සංචිත කළමනාකරණය කරනු ලබන අතර, එය විදේශ මුදල් සහ අනෙකුත් වත්කම්වලින් සමන්විත වේ. මෙම සංචිත විනිමය අනුපාතිකය ස්ථාවර කිරීමට, ජාත්‍යන්තර වෙළෙඳාමට සහාය වීමට සහ බාහිර කම්පනවලට ඔරොත්තු දීමට ස්වාරක්ෂකයක් සපයයි.

6. ආර්ථික පර්යේෂණ සහ විශ්ලේෂණය:
   මහ බැංකු ආර්ථිකයේ සමස්ත තත්ත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා දත්ත රැස් කිරීම, ආර්ථික උපනති විශ්ලේෂණය සහ ආර්ථික පර්යේෂණ සිදු කරයි. මෙම පර්යේෂණ ඔවුන්ගේ ප්‍රතිපත්ති තීරණ සඳහා අවශ්‍ය තොරතුරු ලබා දෙයි.

මහ බැංකුවල නිශ්චිත භූමිකාවන් සහ කර්තව්‍යයන් රටවල් හරහා වෙනස් විය හැකි අතර ඒවා අදාළ නීති රාමු සහ ආර්ථික තත්ත්වයන් මත රඳා පවතින බව සැලකිල්ලට ගැනීම වැදගත්ය.

### 9.2 මුදල් ප්‍රතිපත්තිය යනු කුමක්ද? එය වැදගත් වන්නේ ඇයි?

මුදල් ප්‍රතිපත්තිය යනු ආර්ථිකයක් තුළ මුදල් සැපයුම සහ මුදලේ පිරිවැය නියාමනය කිරීම සඳහා මහ බැංකුවක් විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයි. ආර්ථික උච්චාවචනයන් කළමනාකරණය කිරීමට සහ මිල ස්ථායිතාව ළඟා කර ගැනීමට මහ බැංකු මුදල් ප්‍රතිපත්තිය භාවිතා කරයි. මිල ස්ථායිතාව යන්නෙන් අදහස් කරන්නේ උද්ධමනය අඩු සහ ස්ථාවර මට්ටමේ පවත්වා ගැනීමයි. බොහෝ දියුණු ආර්ථිකයන්හි මහ බැංකු පැහැදිලි උද්ධමන ඉලක්ක ප්‍රකාශ කරයි. බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් ද උද්ධමනය ඉලක්ක කර ගනිමින් ගමන් කරයි. වර්තමානයේදී, ශ්‍රී ලංකා මහ බැංකුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවකට අනුකූල ව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබයි.

සාමාන්‍යයෙන් මහ බැංකු විවට වෙළෙඳපොළ කටයුතු ක්‍රමය යටතේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරයි. වෙළෙඳපොළේ සුරැකුම්පත් මිලදී ගැනීම හෝ විකිණීම හරහා මුදල් සැපයුම පාලනය කරයි. විවට වෙළෙඳපොළ කටයුතු කෙටි කාලීන පොලී අනුපාතවලට බලපාන අතර, කෙටි කාලීන පොලී අනුපාත දිගු කාලීන පොලී අනුපාත සහ ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි බලපායි. මහ බැංකු ප්‍රතිපත්ති පොලී අනුපාත අඩු කරන විට, මුදල් ප්‍රතිපත්තිය ලිහිල් වේ. ඔවුන් ප්‍රතිපත්ති පොලී අනුපාත ඉහළ නංවන විට, මුදල් ප්‍රතිපත්තිය දැඩි වේ.

### 9.3 ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ විවට වෙළෙඳපොළ කටයුතු

වර්තමානයේදී, ශ්‍රී ලංකා මහ බැංකුව සක්‍රීය විවට වෙළෙඳපොළ කටයුතු ක්‍රමය යටතේ සිය මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරයි. මෙම ක්‍රමයේ ප්‍රධාන අංග වනුයේ: (i) නිත්‍ය තැන්පතු

පහසුකම් අනුපාතිකය (*Standing Deposit Facility Rate* - SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (*Standing Lending Facility Rate* - SLFR) යන ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික මගින් සැකසුණු පොලී අනුපාතික කොරිඩෝව සහ (ii) විවට වෙළෙඳපොළ කටයුතු වේ.

නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යනු ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු පද්ධතියෙන් කෙටි කාලීන අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කරන ගනුදෙනුවලට අදාළ වන දෛනික පොලී අනුපාතිකයයි. මෙහිදී මහ බැංකුවෙහි ඇති තම වත්කම් සඳහා පොලී ලැබීමෙන් බැංකු ප්‍රතිලාභ ලබයි. නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යනු ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවලට මහ බැංකුවෙන් කෙටි කාලීන අරමුදල් ලබා ගත හැකි පොලී අනුපාතිකයයි. මෙම ප්‍රතිපත්ති පොලී අනුපාතික මගින් වෙළඳපොළ පොලී අනුපාතවලට බලපෑම් කිරීමට, උද්ධමනය පාලනය කිරීමට, සමස්ත මුදල් ප්‍රතිපත්තිය කළමනාකරණය කිරීමට සහ එමගින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් කිරීමට මහ බැංකුවට හැකියාව ඇත.

වෙළෙඳපොළ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා විවට වෙළෙඳපොළ කටයුතු පවත්වනු ලැබේ. විවට වෙළෙඳපොළ කටයුතු රජයේ සුරැකුම්පත් ස්ථාවර හෝ තාවකාලික පදනම යටතේ මිලදී ගැනීමේ/විකිණීමේ වෙන්දේසි හරහා සිදු කරනු ලැබේ.

**9.4 ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව**

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (*Statutory Reserve Ratio* - SRR) යනු වාණිජ බැංකු විසින් සිය තැන්පතුවලින් යම් ප්‍රතිශතයක් මුදල් තැන්පතුවක් ලෙස මහ බැංකුවෙහි පවත්වාගෙන යා යුතු ප්‍රමාණයයි. එය සමහර රටවල සංචිත අවශ්‍යතා අනුපාතය (*Reserve Requirement Ratio* – RRR) හෝ මුදල් සංචිත අනුපාතය (*Cash Reserve Ratio* – CRR) ලෙසද හැඳින්වේ. ශ්‍රී ලංකාවේ වර්තමානයේදී ශ්‍රී ලංකා රුපියල්වලින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල පවත්වා ගනු ලබන ඉල්ලුම්, කාලීන හා ඉතුරුම් තැන්පතු ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවට යටත් වේ.

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙහි පරමාර්ථය වන්නේ බැංකු පද්ධතියේ ස්ථායිතාවය සහ ශක්තිමත් බව සහතික කිරීම, මුදල් සැපයුම පාලනය කිරීම සහ ආර්ථිකයේ ණය දීම සහ උද්ධමන පීඩනය කෙරෙහි බලපෑම් කිරීමයි. අනිවාර්ය සංචිත අනුපාතයක් සැකසීමෙන්, මහ බැංකුවට වාණිජ බැංකුවලට ණය දිය හැකි අරමුදල් ප්‍රමාණය පාලනය කළ හැකි අතර එය ආර්ථිකයේ සමස්ත ද්‍රවශීලතාවයට සහ ණය ලබා ගැනීමේ හැකියාවට බලපායි. මහ බැංකුව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ නංවන විට, වාණිජ බැංකු පවත්වාගෙන යා යුතු සංචිත ප්‍රමාණය ඉහළ යයි. එම නිසා ණය දීමට ඇති මුදල් ප්‍රමාණය අඩු වේ. මෙය අධික ණය දීම සහ ණය ප්‍රසාරණය වැළැක්වීමට උපකාරී වන අතර එමඟින් උද්ධමන පීඩනය පාලනය කරයි. අනෙක් අතට, මහ බැංකුව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කරන විට සංචිත අවශ්‍යතාවය අඩු වෙයි. බැංකුවලට අතිරික්ත අරමුදල් ණයට දීමට ඉඩ සැලසෙයි. එමගින් ඉහළ යන ද්‍රවශීලතාව ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය කරයි.

නිශ්චිත ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ආර්ථික තත්ත්වයන්, මුදල් ප්‍රතිපත්තියෙහි ඉලක්ක සහ මූල්‍ය ස්ථායිතාව සලකා බැලීම ඇතුළු විවිධ සාධක මත පදනම්ව මහ බැංකුව විසින් තීරණය කරනු ලැබේ. විවිධ වර්ගයේ තැන්පතු හෝ බැංකු සඳහා අනුපාතය වෙනස් විය හැකි අතර, මුදල් තත්ත්වයන් කළමනාකරණය කිරීමට සහ අපේක්ෂිත ප්‍රතිපත්ති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය කාලානුරූපව සකස් කිරීමට මහ බැංකුවලට බොහෝ විට බලය ඇත. ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම කෙරෙහි බලපෑම් කිරීම සඳහා අතීතයේදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය බහුල වශයෙන් යොදා ගන්නා ලදී. කෙසේ වෙතත්, වෙළඳපොළ පදනම් කරගත් මුදල් ප්‍රතිපත්තියට වැඩි වශයෙන් නැඹුරු වීමත් සමඟ මුදල්

ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා කෙරෙහි යොමු වීම ක්‍රමානුකූලව අඩු වී ඇත.

### 9.5 මුදල් ප්‍රතිපත්තිය මෑතකදී භාවිත කර ඇත්තේ කෙසේද?

2007 දී ආරම්භ වූ ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසුව, දියුණු ආර්ථිකයන්හි මහ බැංකු කෙටි කාලීන පොලී අනුපාත බිංදුවට ආසන්න වන තෙක් පොලී අනුපාත අඩු කිරීමෙන් මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කළහ. සමහර මහ බැංකු සාම්ප්‍රදායික නොවන මූල්‍ය ප්‍රතිපත්ති භාවිතා කරමින් දිගු කාලීන බැඳුම්කර මිලදී ගනිමින් දිගු කාලීන පොලී අනුපාත තවදුරටත් අඩු කළහ. ඇතැම් මහ බැංකු බිංදුවට වඩා කෙටි කාලීන පොලී අනුපාත අඩු කළහ. කොවිඩ්-19 වසංගතයට ප්‍රතිචාර වශයෙන්, මහ බැංකු මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමට සහ වෙළඳපොළවලට ද්‍රවශීලතාව සැපයීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී. මුදල් හා බැඳුම්කර වෙළඳපොළවල පීඩනය අවම කිරීම සඳහා, බොහෝ නැගී එන වෙළඳපොළ මහ බැංකු විදේශ විනිමය වෙළඳපොළවලට මැදිහත්වූ අතර පළමු වතාවට වත්කම් මිලදී ගැනීමේ වැඩසටහන් භාවිතා කරන ලදී. වඩාත් මෑතකදී, ශීඝ්‍රයෙන් ඉහළ යන උද්ධමනයට ප්‍රතිචාර වශයෙන්, ලොව පුරා මහ බැංකු පොලී අනුපාත වැඩි කිරීම මගින් මුදල් ප්‍රතිපත්ති දැඩි කර ඇත.

### 9.6 මූල්‍ය පද්ධති ස්ථායීතාව

ආර්ථිකයක් තුළ මූල්‍ය ස්ථායීතාව සහතික කිරීම සඳහා මහ බැංකුකරණය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එය මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, මූල්‍ය ආයතන අධීක්ෂණය සහ නියාමනය කිරීම සහ මූල්‍ය පද්ධතියේ සමස්ත ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා වගකීම දරයි. මූල්‍ය පද්ධති ස්ථායීතාව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධානතම අරමුණුවලින් එකකි. මහ බැංකු බැංකු, රක්ෂණ සමාගම් සහ අනෙකුත් මූල්‍ය අතරමැදියන් ඇතුළු මූල්‍ය ආයතන අධීක්ෂණය සහ නියාමනය කරයි. ඔවුන් විචක්ෂණශීලී ප්‍රමිතීන් ස්ථාපිත කරන අතර මූල්‍ය පද්ධතියේ ආරක්ෂාව සහ සෞභාග්‍ය සහතික කිරීම සඳහා නිරන්තරයෙන් පරීක්ෂණ සිදු කරයි. මෙම අධීක්ෂණවල අරමුණු වන්නේ අධික අවදානම් ගැනීම වැලැක්වීම, ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගැනීම සහ පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමයි. මහ බැංකු මූල්‍ය පද්ධතියේ සමස්ත ස්ථායීතාව සමීපව නිරීක්ෂණය කරයි. ඔවුන් ආර්ථික දර්ශක විශ්ලේෂණය කරමින් අවදානම් තක්සේරු කරයි. එමගින් මූල්‍ය ස්ථාවරත්වයට තර්ජනයක් විය හැකි අවදානම් හඳුනා ගනී. මෙම සොයා ගැනීම් පදනම් කර ගනිමින්, මහ බැංකු එම ආයතනවල කළමනාකරීත්වය සමග අඛණ්ඩව සන්නිවේදනය සිදු කරන අතර, නිරීක්ෂණය මත ගැටලු හා දුර්වලතා විසඳීමට ආයතන ක්ෂණික ක්‍රියාමාර්ගවලට මුල පිරීම අපේක්ෂා කෙරේ.

මූල්‍ය අර්බුදයකදී, මහ බැංකු අනෙකුත් නියාමන අධිකාරීන් සහ රාජ්‍ය ආයතන සමඟ සහයෝගීව අර්බුදයේ බලපෑම කළමනාකරණය කිරීමට සහ අවම කිරීමට කටයුතු කරයි. පාඩු ලබන ආයතනයක් පවතින විට මහ බැංකු නියාමකයෙක් ලෙස මැදිහත් වී එ වන් ආයතන බේරුම් කිරීම සිදු කරන අතර එ වැනි ආයතනවල අසාර්ථක වීමකදී අහිතකර ඵලවිපාක පුළුල් ව ආර්ථිකය කෙරෙහි  ඇති විය හැකි බලපෑම් අවම කිරීම සිදු කරනු ලබයි. මූල්‍ය පද්ධතියේ අවදානම් ආමන්ත්‍රණය කිරීම සඳහා මහ බැංකු සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති මෙවලම් ද යොදා ගනී. මෙම ප්‍රතිපත්ති තනි පුද්ගල ආයතන කෙරෙහි පමණක් අවධානය යොමු කරනවාට වඩා විවිධ ආයතන සහ වෙළෙඳපොළවල අන්තර් ක්‍රියාකාරිත්වයෙන් ඇතිවිය හැකි අවදානම් කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරයි. ගෝලීය මූල්‍ය ස්ථායීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකු අනෙකුත් මහ බැංකු සහ ජාත්‍යන්තර සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කරයි.

### 9.7 මුදල් නිකුත් කිරීම

වර්තමානයේදී බොහෝ රටවල මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කරනු ලබන්නේ මහ බැංකුව මගිනි. ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි නිර්මාණය කිරීම, මුද්‍රණය/ටංකනය කිරීම හා

බෙදාහැරීම බොහෝ විට මහ බැංකු වෙත පැවරී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශ කර ඇති ආකාරයට ව්‍යවහාර මුදල් කළමනාකරණයේ පරමාර්ථය වන්නේ ව්‍යවහාර මුදල්වල වටිනාකම හා විශ්වාසනීයත්වය ආරක්ෂා කර ගැනීම හා ආර්ථිකයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා අත්‍යවශ්‍ය වන, ව්‍යවහාර මුදල් සඳහාවන ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත්වන පරිදි තොග පවත්වාගෙන යාම තුළින් මුදල් පිළිබඳ මහජන විශ්වාසය ගොඩනගා පවත්වාගෙන යාමයි.

### 9.8 ගෙවීම් පද්ධති නියාමනය හා සුපරීක්ෂණය

මහ බැංකු ඔවුන්ගේ රට/කලාපය තුළ ගෙවීම් පද්ධති නියාමනය සහ අධීක්ෂණය කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ගෙවීම් පද්ධති යනු පුද්ගලයන්, ව්‍යාපාර සහ මූල්‍ය ආයතන අතර අරමුදල් හුවමාරු කිරීමට පහසුකම් සැලසීමට භාවිතා කරන යටිතල පහසුකම් සහ විධිවිධාන වේ. මහ බැංකු ගෙවීම් පද්ධති සඳහා නියාමන රාමුව ස්ථාපිත කර බලාත්මක කරයි. ඔවුන් ගෙවීම් පද්ධතිවල ක්‍රියාකාරිත්වය පාලනය කරන නීති රීති, ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශ නිර්වචනය කරයි. එපමණක් නොව, ඒවායේ ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ අඛණ්ඩතාව සහතික කරයි. මහ බැංකු  ගෙවීම් පද්ධතිවල ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කිරීම සහ අවදානම් අවම කිරීම සඳහා ඒවා අධීක්ෂණය කරයි. ඔවුන් ගෙවීම් පද්ධතිවල සමස්ත ස්ථායීතාවය සහ සඵලතාවය තක්සේරු කරයි. දුර්වලතා හඳුනාගෙන ඒවා විසඳීමට ද මහ බැංකු පියවර ගනියි. රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා ගෙවීම් පද්ධතිවලට සහභාගිවන්නන් නිරන්තර පරීක්ෂා කිරීම සහ විගණනය ද මහ බැංකුවලට සිදු කළ හැකිය. එමෙන්ම, මහ බැංකු ගෙවීම් පද්ධති සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාත්මක කරයි. ඉලෙක්ට්‍රොනික ගෙවීම් භාවිතය ප්‍රවර්ධනය කිරීම, ගෙවීම් අංශයේ නවෝත්පාදන සහ තරඟකාරිත්වය දිරිමත් කිරීම, සහ ආරක්ෂිත සහ කාර්යක්ෂම ගෙවීම් තාක්ෂණයන් අනුගමනය කිරීමට පහසුකම් සැලසීම ද මහ බැංකුවල කාර්යභාරයට ඇතුළත් වේ.

### 9.9 විනිමය අනුපාත කළමනාකරණය

මහ බැංකු තම රට/කලාපය සඳහා විනිමය අනුපාත ක්‍රමය තීරණය කරයි. ප්‍රධාන විනිමය අනුපාත ක්‍රම අතරට ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය, පූර්ණ පාවෙන විනිමය අනුපාතික ක්‍රමය සහ පාලිත පාවෙන විනිමය අනුපාතික ක්‍රමය ඇතුළත් වේ. මහ බැංකු විනිමය අනුපාතිකයට බලපෑම් කිරීමට සහ අධික අස්ථාවරත්වයන් කළමනාකරණය කිරීමට මැදිහත් වේ. එය ඍජු මැදිහත්වීමක් (මුදල් මිලදී ගැනීම හෝ විකිණීම) හෝ වක්‍ර මැදිහත්වීමක් (පොලී අනුපාත ගැලපීම හෝ ප්‍රාග්ධන පාලනයන් ක්‍රියාත්මක කිරීම) විය හැක. මහ බැංකු විදේශ විනිමය සංචිත පවත්වා ගෙන යන අතර ඒවා විදේශ මුදල් සහ අනෙකුත් ජාත්‍යන්තර වත්කම් වලින් සමන්විත වේ. විනිමය අනුපාත අස්ථාවරත්වය කළමනාකරණය කිරීමට සහ අහිතකර මූල්‍ය තත්ත්වලදී ද්‍රවශීලතාව සැපයීම සඳහා සංචිත ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කරයි. විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් වීමට සහ ඔවුන්ගේ මුදල්වල වටිනාකමට බලපෑම් කිරීමට මහ බැංකු සංචිත භාවිතා කරයි. මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණයේදී විනිමය අනුපාත තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මහ බැංකු මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී විනිමය අනුපාත චලනයන් සලකා බලයි. පොලී අනුපාතවල වෙනස්වීම් විනිමය අනුපාතවලට බලපෑ හැකි අතර, එය ආනයන හා අපනයන තරඟකාරිත්වය, උද්ධමනය සහ සමස්ත ආර්ථික තත්ත්වයන් කෙරෙහි බලපායි.

### 9.10 අනාගත අභියෝග

ගෝලීයකරණ ක්‍රියාවලිය 1970 දශකයේ අග භාගයේ සිට වේගයෙන් වර්ධනය වී ඇත. 2007-2010 ගෝලීය මූල්‍ය අර්බුදය ඇතුළුව මූල්‍ය අර්බුදවල ස්වරූපයෙන් විවිධ බාධා ගෝලීයකරණ ක්‍රියාවලියට එල්ල වුවත්, ගෝලීයකරණයේ තීව්‍රතාවය දිගටම පවතිනු ඇත. ගෝලීයකරණය සහ මහ බැංකුකරණය ක්‍රම කිහිපයකින් බැඳී ඇත. ගෝලීයකරණය රටවල් අතර අන්තර් ආර්ථික රඳා පැවැත්ම වැඩි කිරීමට හේතු වී ඇත. ගෝලීය ආර්ථික ඒකාබද්ධතාවය හමුවේ

දේශීය ආර්ථිකය කළමනාකරණය කිරීම සහ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා මහ බැංකු තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ඔවුන්ගේ දේශීය මූල්‍ය ප්‍රතිපත්ති මත වෙළඳ ප්‍රවාහ, ප්‍රාග්ධන ප්‍රවාහ සහ විනිමය අනුපාත චලිතයන් වැනි ගෝලීය ප්‍රවණතාවන්හි බලපෑම් සලකා බැලිය යුතුය. අනාගත අභියෝගවලට මුහුණ දීම සඳහා, මහ බැංකු තම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හැකියාව වැඩි දියුණු කර ගැනීම පිළිබඳව අවධානය යොමු කළ යුතුය. 2010 දී වූ, රමේෂ්, හව්ලට් සහ ෆ්‍රිට්සන් විසින් යෝජනා කරන ලද රාජ්‍ය ප්‍රතිපත්ති රාමුවේ නිර්වචනය කර ඇති පරිදි විශ්ලේෂණාත්මක ධාරිතාව, සංවිධානාත්මක ධාරිතාව සහ දේශපාලනික ධාරිතාව වැඩි දියුණු කිරීම මගින් මෙය කළ හැක. ශ්‍රී ලංකා මහ බැංකු නව පනත් කෙටුම්පත මගින් මහ බැංකුව ස්වාධීන ආයතනයක් බවට පත් කර, ඵලදායී සේවාවක් ලබාදීම සඳහා එහි ආයතනික රාමුව ශක්තිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. අනාගතයේදී ගෝලීයකරණය තව දුරටත් තීව්‍ර වීම මහ බැංකු ක්‍රියාකළ යුතු ආර්ථික හා මූල්‍ය පරිසරය සංකීර්ණ කළ හැකිය. වෙනස්වන ගෝලීය පරිසරයට අනුගත වීම සඳහා මහ බැංකු විසින් නව ප්‍රතිපත්ති රාමු ස්ථාපනය කිරීම, ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම සහ ගෝලීය ආර්ථික හා මූල්‍ය වර්ධනයන් සමීපව නිරීක්ෂණය කිරීම සහ විශ්ලේෂණය කිරීම අත්‍යවශ්‍ය වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Central Bank of Sri Lanka – A Bill. (7 March 2023).

Central Bank of Sri Lanka. (2018). Central Bank of Sri Lanka. Retrieved from https://www.cbsl.gov.lk/en

Herger, N. (2019). Understanding central banks. Springer.

Moenjak, T. (2014). Central banking: Theory and practice in sustaining monetary and financial stability. John Wiley & Sons.

World Bank. (2022). Finance for an Equitable Recovery. International Bank for Reconstruction and Development / The World Bank.

Wu, X., Ramesh, M., Howlett, M., & Fritzen, S. A. (2010). The Public Policy Primer: Managing the Policy Process. Routledge.